# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,516 - 2007 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා - 2007.09.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | 1054 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1062 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1056 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1064 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 995 | විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 සැප්තැම්බර් මස 28 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 සැප්තැම්බර් මස 14 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

**දුම්රිය පාලම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍යය එම්එස් යූ. බීම්ස්, එම්එස් ඇන්ගල්ස්, එම්එස් චැනල්ස්, එම්එස් ප්ලේට්ස් සහ ඔටෝ ෆැබ් බීම්ස් සැපයීම සඳහා මිල ගණන් කැඳවීම**

කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 01 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේ, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් දුම්රිය පාලම් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය එම්එස් යූ බීම්ස්, එම්එස් ඇන්ගල්ස්, එම්එස් චැනල්ස්, එම්එස් ප්ලේට්ස් සහ ඔටෝ ෆැබ් බීම්ස් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින් සහ/හෝ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල දීමනාපත් භාරගනු ලැබේ. නිෂ්පාදකයින්ට ඔවුන්ගේ මිල දීමනා කෙලින් ම හෝ ඔවුන් විසින් නීත්‍යානුකූලව බලය පවරනු ලැබූ ඒජන්තවරුන් මාර්ගයෙන් ඉදිරිපත් කළ හැක

02. මිල දීමනාපත් භාරගැනීම 2007.10.11 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කරනු ලැබේ.

03. ආපසු නොගෙවනු ලබන රු. 5,000 ක මුදලක් හෝ පහසුවෙන් මාරුකළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වලින් 2007.10.08 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් මිල දීමනා ඉදිරිපත් කළ යුතුය.

04. මිල දීමනාපත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ, අංක 01 හි පිහිටි ප්‍රවාහන අමාත්‍යාංශයේදී මිල දීමනා විවෘත කිරීම සිදු කෙරේ. එම අවස්ථාවට මිල දීමනාකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

05. මෙම විෂයයන් නිෂ්පාදනය/සැපයීම භාරගනු ලබන ආයතන **ISO 9001 : 2000 / BS EN ISO 9001 : 2000** ට හෝ ඒ හා සමාන පිළිගත හැකි ජාත්‍යන්තර තත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය. මිල දීමනාපත් ඉදිරිපත් කරන අවස්ථාවේ දී කල් ඉකුත් වූ තත්ව පාලන සහතික පිළිගනු නොලැබේ.

06. මුද්‍රා තැබූ මිල දීමනාපත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් භාර දීමට හැක.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය,
අංක 01, ඩී. ආර්. විජේවර්ධන මාවත.
කොළඹ 10,
ශ්‍රී ලංකාව.

07. කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී මිල දීමනා ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ 10. ශ්‍රී ලංකාව.
දුරකතන අංක :94(11)2432044 හෝ 94(11)2436818.

සභාපති,
අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,
ප්‍රවාහන අමාත්‍යාංශය.

යොමුව: එස්ආර්එස්/එෆ් 6551.

09-826

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයේ එස්. 9 බලවේග කට්ටල සඳහා ලොකෝමෝටිව් ස්ටාර්ටින් ඇල්කලයින් බැටරි කට්ටල 10ක් සැපයීම**

කොළඹ 10, ඕල්කොට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවයේ එස්. 9 බලවේග කට්ටල සඳහා ලොකෝමෝටිව් ස්ටාර්ටින් ඇල්කලයින් බැටරි කට්ටල 10ක් සැපයීම සඳහා මුද්‍රා තබන ලද මිල දීමනා පත් නිෂ්පාදකයින්ගෙන් හා/හෝ සැපයුම්කරුවන්ගෙන් භාරගනු ලබයි. නිෂ්පාදකයින්ට ඔවුන්ගේ මිල ගණන් ඔවුන් විසින් ඇටෝර්නි බලය පවරන ලද නියෝජිතයෙකු මාර්ගයෙන් හෝ කෙලින් ම ඉදිරිපත් කළ හැක.

02. 2007.11.01 දින ප. ව. 2.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා මිල දීමනා පත් භාරගනු ලැබේ.

03. ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක මුදලක් හෝ පහසුවෙන් හුවමාරු කළ හැකි ඒ හා සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාල වලින් 2007.10.30 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි මිල දීමනා ආකෘති පත්‍රවල පමණක් මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

04. මිල දීමනාපත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය මූලස්ථානයේ දී මිල දීමනා පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට මිල දීමනා කරුවන්ට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

05. මුද්‍රා තබන ලද මිල දීමනා පත් පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාද කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී මිල දීමනා ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක.

07. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කොට් මාවත, කොළඹ 10.
දුරකතන අංක : 94(11) 2432044 හෝ 94 (11) 2436818.
ෆැක්ස් අංකය: 94(11) 2432044 ඊ මේල් : srs@sierra.lk
(යොමුව :එස්. ආර්. එස්/එෆ් 6546)

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(ප්‍රධාන)

09-827

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

දුම්රිය සේවය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ පිළිබඳ රේගු සහ වරාය ලිපි ලේඛන පිළියෙල කිරීම, නිෂ්කාශනය කිරීම සහ කොළඹ වරායේ සිට සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට මරදාන, රාගම, රත්මලාන සහ දෙමටගොඩ යන දුම්රිය ගබඩා වෙත ප්‍රවාහනය කිරීම

කොළඹ 10, ඕල්කොට් මාවතේ, පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ සාමාන්‍යාධිකාරී කාර්යාලයේ ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ආනයනය කරනු ලබන භාණ්ඩ පිළිබඳ රේගු සහ වරාය ලිපි ලේඛන පිළියෙල කිරීම, වාප්පු නිෂ්කාශන කටයුතු ඇතුළු භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ඒ පිළිබඳ අවම වශයෙන් වසර 10 ක පළපුරුදු කොන්ත්‍රාත්කරුවන්ගෙන් මුද්‍රා තබන ලද මිල දීමනාපත් භාරගනු ලැබේ.

02. 2007.10.24 දින ප. ව. 2.00 දක්වා මිළ දීමනාපත් භාරගනු ලැබේ.

03. ආපසු නොගෙවනු ලබන රු. 2,000 ක මුදලක් ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් 2007.10.22 දින ප. ව. 3.00 දක්වා ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් මිල දීමනා ඉදිරිපත් කළ යුතුය.

04. මිල දීමනාපත් භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී මිල දීමනාපත් විවෘත කරනු ලබන අතර එම අවස්ථාවට මිල දීමනා ඉදිරිපත් කරන්නන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට සහභාගි විය හැකිය.

05. මුද්‍රා තබන ලද මිල දීමනාපත් ගෙනැවිත් භාරදීමට හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය හැක.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාද කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය සාමාන්‍යාධිකාරී කර්යාලය,
ඕල්කොට් මාවත, කොළඹ 10.

06. කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේදී ආකෘතිපත් නොමිලයේ පරීක්ෂා කර බැලිය හැකි අතර වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරිගෙන් විමසන්න.

දුරකතන අංක : 2432044 හෝ 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(ප්‍රධාන).

ශ්‍රී ලංකා දුම්රිය සේවය.
යොමුව එස්ආර්එස්/එෆ් 6579.

09-870

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන දැන්වීම

### ජන්ෂන් ෆිෂ් ප්ලේට්ස් (Junction Fish Plates) යුගල 950ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් කැඳවීම

කොළඹ 10, ඕල්කොට් මාවතේ පිහිටි ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (ප්‍රධාන) සභාපති විසින් පහත සඳහන් විෂයයන් මිලදී ගැනීම සඳහා නිෂ්පාදකයින් /සැපයුම්කරුවන් විසින් ඉදිරිපත් කරන මුද්‍රා තබන ලද මිල දීමනා පත්‍ර භාරගනු ලැබේ.

| *විෂය* | *ප්‍රමාණය* |
|---|---|
| 1. ජන්ෂන් ෆිෂ් ප්ලේට්ස් 80/90 ඒ රේල් පීලි සඳහා | යුගල 600 |
| 2. ජන්ෂන් ෆිෂ් ප්ලේට්ස් 88/90 ඒ රේල් පීලි සඳහා | යුගල 350 |

02. ආපසු නොගෙවනු ලබන රු. 2,500 ක මුදලක් හෝ පහසුවෙන් මාරු කළ හැකි ඒ සමාන විදේශ විනිමය ප්‍රමාණයක් ගෙවා කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් හෝ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල වලින් 2007.10.29 දින ප. ව. 3.00 (ශ්‍රී ලංකා වේලාවෙන්) දක්වා ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් මිල දීමනා ඉදිරිපත් කළ යුතුය.

03. මිල දීමනාපත් භාරගැනීම 2007.10.31 දින ප. ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කරනු ලැබේ.

04. මෙම විෂය නිෂ්පාදනය/සැපයුම භාරගනු ලබන ආයතන ISO 9001 : 2000 /BSEN ISO 9001 : 2000 ට හෝ වෙනත් පිළිගත හැකි ජාත්‍යන්තර තත්ව පාලන ප්‍රමිතීන්ට අනුකූල විය යුතුය.

05. මිල දීමනාපත් භාර ගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කොට් මාවතේ දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී ඒවා විවෘත කරනු ලබන අතර එම අවස්ථාව ට දීමනාකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයින්ට සහභාගි විය හැකිය.

06. මුද්‍රා තබන ලද මිල දීමනා පත් ගෙනවිත් භාරදීමට හෝ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය හැකිය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාද කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කොට් මාවත, කොළඹ 10.
ශ්‍රී ලංකාව.

06. කොළඹ 10, ඕල්කට් මාවතේ පිහිටි දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී මිළ දීමනා ආකෘති පත්‍ර නොමිලයේ පරීක්ෂා කර බැලිය හැක. වැඩි විස්තර සඳහා දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් විමසන්න.

දුරකථන අංක : 94 (11) 2432044 හෝ 94 (11) 2436818.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
(ප්‍රධාන).

ශ්‍රී ලංකා දුම්රිය සේවය.
යොමුව එස්ආර්එස්/එෆ්/6589.

09-871

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - මතුගම

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. මෙම අධිකරණයේ නඩුවලට අදාල රාජ සන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් ඉදිරිපත් කරනු නොලැබූ පහත සඳහන් භාණ්ඩ 2007.11.03 වැනි දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසි පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

3. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිලිගැනෙන අවස්ථාවන් හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාර ගනු නොලැබේ.

6. භාණ්ඩ ගැනුම්කරුවන් අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම් පත රැගෙන ආ යුතුය.

ආර්. එස්. ඒ. දිසානායක,
මහෙස්ත්‍රාත්/ අතිරේක දිසා විනිසුරු

2007 සැප්තැම්බර් මස 03 වැනි දින
මතුගම මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව 2007 වර්ෂය

| *අනු අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | ඒ ආර්1061/6 | අංක රහිත හොන්ඩා සී 50 වර්ගයේ යතුරු පැදි | 01 |
| 02 | ඒ ආර් 1040/6 | අංක 10-5723 දරන යමහා ට්‍රේල් වර්ගයේ යතුරු පැදිය | 01 |
| 03 | ඒ ආර් 719/7 | අංක 109-7336 දරන හෝන්ඩා යතුරු පැදිය | 01 |
| 04 | ඒ ආර් 722/6 | අංක 107-3838 හොන්ඩා එම්ඩී 90 වර්ගයේ යතුරු පැදිය | 01 |
| 05 | ඒ ආර් 487/7 | අංක 123-7143 හොන්ඩා සී බී 125 ටී වර්ගයේ යතුරු පැදිය | 01 |
| 06 | ඒ ආර් 1571/6 | අංක 113-6414 යමහා වී 90 ටී වර්ගයේ යතුරු පැදිය | 01 |
| 07 | ඒ ආර් 362/3 | අංක 122 ශ්‍රී 7272 හොන්ඩා යතුරු පැදිය | 01 |
| 08 | අංක රහිත | අංක 129-4252 යමහා සීඩීටී වර්ගයේ යතුරු පැදිය | 01 |
| 09 | බීආර් 892/92 | අංක 123-9043 හොන්ඩා සී 70 වර්ගයේ යතුරු පැදිය | 01 |
| 10 | ඒ ආර් 362/3 | අංක රහිත යමහා මේට් යතුරු පැදි | 01 |
| 11 | අංක රහිත | අංක 121-4918 යමහා මේට් 50 වර්ගයේ යතුරු පැදි | 01 |
| 12 | 49257 | අංක 144-4033 යමහා සීඩී 50 වර්ගයේ යතුරු පැදි | 01 |
| 13 | අංක රහිත | අංක 96-2123 හොන්ඩා එම්බී 90 වර්ගයේ යතුරු පැදි | 01 |
| 14 | ඒ ආර් 315/2000 | අංක 124-2807 හොන්ඩා යතුරු පැදිය | 01 |
| 15 | අංක රහිත | අංක 105-0621 හොන්ඩා යතුරු පැදිය | 01 |
| 16 | අංක රහිත | අංක රහිත කවසාකි යතුරු පැදිය | 01 |
| 17 | ඒ ආර් 1499/4 | අංක 101-9763 හොන්ඩා හෝක් වර්ගයේ යතුරු පැදිය | 01 |
| 18 | ඒ ආර් 1495/ 4 | අංක 107 ශ්‍රී 7443 හොන්ඩා එම්බී 5 වර්ගයේ යතුරු පැදි | 01 |
| 19. | 61842 | අංක 24 ශ්‍රී 694 ඔස්ටින් ලොරි රථය | 01 |
| 20. | 07821 | අංක 28-6955 එල්ෆ් ලොරි රථය | 01 |
| 21. | ඒආර් 1107/6 | අංක 200-6077 බජාජ් ත්‍රීවීල් රථය | 01 |
| 22. | ඒ ආර් 451/4 | වර්ගය හා අංකය අපැහැදිලි පා පැදි | 01 |
| 23. | ඒ ආර් 221/5 | වර්ගය හා අංකය අපැහැදිලි පා පැදි | 01 |
| 24. | ඒ ආර් 1077/6 | කළු පාට පාපැදි | 01 |
| 25. | ඒ ආර් 1268/6 | රතුපාට ලුමාලා පාපැදි | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 26 | ඒ ආර් 1269/6 | වර්ගය හා අංකය අපැහැදිලි පාපැදි කලුපාට | 01 |
| 27 | ඒ ආර් 398/7 | අංක සීසීඩී 67687 රැලේ පාපැදි | 01 |
| 28. | ඒ ආර් 399/7 | අංකය අපැහැදිලි සුදු මඩ පුවරු සහිත පා පැදිය | 01 |
| 29 | ඒ ආර් 400/7 | අංක 5712815 **X** දරන ලුමාලා පා පැදි | 01 |
| 30 | ඒ ආර් 401/7 | අංක අපැහැදිලි පා පැදි | 01 |
| 31 | ඒ ආර් 485/7 | අංක 1663 වීරියා වර්ගයේ පැපැදි | 01 |
| 32 | ඒ ආර් 718/7 | අංකය අපැහැදිලි ලුමාලා පා පැදි | 01 |
| 33 | ඒ ආර් 720/7 | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 34 | එ ආර් 721/7 | අංක සී 106080 දරණ වර්ගය අපැහැදිලි පා පැදි | 01 |
| 35 | ඒ ආර් 723/7 | අංක 1031756 දරණ පා පැදිය | 01 |
| 36 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 37 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 38 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 39 | අංක රහිත | හීරෝ වර්ගයේ පාපැදි | 01 |
| 40 | අංක රහිත | හී රෝ වර්ගයේ පාපැදි | 01 |
| 41 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 42 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 43 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 44 | අංක රහිත | ඇට්ලස් 2000 වර්ගයේ පා පැදි | 01 |
| 45 | අංක රහිත | ෂිමානො රේසින් වර්ගයේ පා පැදි | 01 |
| 46 | අංක රහිත | අංකය හා වර්ගය අපැහැදිලි පාපැදි | 01 |
| 47 | 49324 | දම්වැල් කියත් | 01 |
| | 44686 | අංක 267 පී සුපර් බලියෝ මැක් වර්ගයේ දම්වැල් කියත් | 01 |
| 49 | 83328 | අංක 3/87211, 16/058, 415,063-451 දම්වැල් කියත් | 01 |
| 50 | 11145 | ටැස්ටෝ තැඹිලි පාට දම්වැල් කියත් | |
| 51 | 79175 | ස්ටීල් වර්ගයේ දම්වැල් කියත් | 01 |
| 52 | අංක රහිත | අංක රහිත ගෑස් ලිප් | 01 |
| 53 | 11735 | i. කහපාට ලාෆ් ගෑස් සිලින්ඩර් | 02 |
| | | ii. වට 4කින් යුත් ගෑස් ලිප් | 01 |
| 54 | 17025 | දැති සහිත රවුම් ඉරුම් කියත් | 01 |
| 55 | 81901 | i. කහපාට ලාෆ් ගෑස් සිලින්ඩ 6 | 02 |
| | | ii. ගෑස් ලිප් | 03 |
| 56 | අංක රහිත | ගෑස් ලිප් | 01 |
| 57 | අංක රහිත | ගෑස් ලිප් | 01 |
| 58 | අංක රහිත | ගෑස් ලිප් | 01 |
| 59 | ඒ ආර් 722/07 | අංක සීථ් 0168 මෝටරෝලා ජංගම දුරකථන | 01 |
| 60 | 3182 | i. ගෑස් සිලින්ඩර් | 01 |
| | | ii. ගෑස් ලිප් - රෙගුලේටරය සහිත | 01 |
| 61 | ඒ ආර් 1010/7 | අංක 1110 නොකියා ජංගම දුරකථන | 01 |
| 62 | ප්‍රා 490/6 | i. විල්බැරෝ | 03 |
| | | ii. සවල් | 12 |
| | | iii. උදලු | 01 |
| | | iv. තාච්චි | 01 |
| 63 | ප්‍රා 496/6 | i. සවල් | 05 |
| | | ii. කුඩ | 01 |
| 64 | ප්‍රා 430/6 | i. සවල් | 01 |
| | | ii. කුඩ | 01 |
| 65 | ප්‍රා 410/6 | i. සවල් | 01 |
| | | ii. කුඩ | 01 |
| 66 | ප්‍රා 353/6 | සවල් | 01 |
| 67 | ප්‍රා. 352/6 | සවල් | 01 |
| 68 | ප්‍රා. 354/6 | සවල් | 01 |
| 69 | ප්‍රා. 334/6 | සවල් | 01 |
| 70 | ප්‍රා. 320/6 | සවල් | 01 |
| 71 | ප්‍රා. 577/6 | ලී අත් යන්ත්‍ර | 02 |
| | | සවල් | 12 |
| | | බාල්දි | 02 |
| 72 | ප්‍රා. 81/7 | සවල් | 01 |
| 73 | 13439 | i සවල් | 02 |
| | | ii. බාල්දි | 01 |
| 74 | 1159 | සවල් | 01 |
| 75 | 11911 | සවල් | 01 |
| 76 | 10836 | සවල් | 01 |
| 77 | ප්‍රා 34/7 | සවල් | 01 |
| 78 | 49303 | ඉරුම් කියත් | 01 |
| 79 | 12320 | ඉරුම් කියත් | 01 |
| 80 | ඒආර් 1111/07 | i. සවල් | 02 |
| | | ii. බාල්දි | 01 |
| | | iii. කුඩ | 01 |
| 81. | ඒ ආර් 950/7 | i. යකඩ තාච්චි | 03 |
| | | ii. අඩි 30 ක පමණ දිග යකඩ කූරු | 01 |
| 82. | 13957 | සවල් | 01 |
| 83 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 84 | 08148 | බන්ඩ් කියත් | 01 |
| 85 | අංක රහිත | බන්ඩ් කියත් | 01 |
| 86 | 12324 | ඉරුම් කියත් | 01 |
| 87 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 88 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 89 | 47151 | ඉරුම් කියත් | 01 |
| 90 | ඒ ආර් 1562/4 | ඉරුම් කියත් | 01 |
| 91 | 43658 | ඉරුම් කියත් | 01 |
| 92 | 6457 | බන්ඩ් කියත් | |
| 93 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 94 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 95 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 96 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 97 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 98 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 99 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 100 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 101 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 102 | අංක රහිත | ඉරුම් කියත් | 01 |
| 103 | අංක රහිත | බන්ඩ් කියත් | 01 |
| 104 | අංක රහිත | බන්ඩ් කියත් | 01 |
| 105 | අංක රහිත | බන්ඩ් කියත් | 01 |
| 106 | අංක රහිත | බන්ඩ් කියත් | 01 |
| 107 | අංක රහිත | සවල් තොගයක් | - |
| 108 | අංක රහිත | යකඩ බාල්දි තොගයක් | - |
| 109 | අංක රහිත | කුඩ තොගයක් | - |
| 110 | 14198 | කුඩ | 01 |
| 111 | 14199 | යකඩ බාල්දි | 01 |
| 112 | 14200 | උදලු | 01 |
| 113 | ඒආර් 402/7 | i. යකඩ තාච්චි | 01 |
| | | ii. සවල් | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 114 | ප්‍රා 600/6 | කුඩ | 01 |
| 115 | ප්‍රා 589/6 | බාල්දි | 01 |
| 116 | ප්‍රා 321/6 | බාල්දි | 01 |
| 117 | ප්‍රා 319/6 | බාල්දි | 01 |
| 118 | ප්‍රා 318/6 | බාල්දි | 01 |
| 119 | ප්‍රා 351/6 | බාල්දි | 01 |
| 120 | 337/6 | බාල්දි | 01 |
| 121 | 333/6 | බාල්දි | 01 |
| 122 | 563/6 | බාල්දි | 01 |
| 123 | 560/6 | බාල්දි | 01 |
| 124 | 388/6 | බාල්දි | 01 |
| 125 | 389/6 | බාල්දි | 01 |
| 126 | 390/6 | බාල්දි | 01 |
| 127 | 391/6 | බාල්දි | 01 |
| 128 | 392/6 | බාල්දි | 01 |
| 129 | 522/6 | කුඩ | 01 |
| 130 | 523/6 | කුඩ | 01 |
| 131 | 524/6 | කුඩ | 01 |
| 132 | 513/6 | කුඩ | 01 |
| 133 | 511/6 | කුඩ | 01 |

09-894

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය

නිකවැරටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද සහ වෙන්දේසි දින දක්වා රාජසන්තක කරන ලද මෙතෙක් අයිතිවාසිකම් නොකියන ලද මෙහි පහත සඳහන් ද්‍රව්‍යයන් 2007.10.06 වැනි දින පෙ. ව. 10.00 ට මෙම සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ මිලදී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියළුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත්/මුදල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

ආර්. එම්. පී. එස්. කේ. රත්නායක,
දිසා විනිසුරු,
මහව - නිකවැරටිය.

2007 අගෝස්තු මස 15 වැනි දින,
මහව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### භාණ්ඩ විස්තරය

| නඩු අංකය | | |
|---|---|---|
| 01. | ඒ. ආර්. 209/2007 | වර්ගයේ යතුරු පැදිය<br>එන්ජින් අංකය : සී 70 ඊ 3002891<br>චැසි අංකය : 3002965 |
| 02. | ඒ. ආර්. 134/07 | හොණ්ඩා සුපර්කබ් වර්ගයේ යතුරුපැදිය<br>එන්ජින් අංකය : සී 90 ඊ 3119244<br>චැසි අංකය : සී 903119252 |
| 03. | 32928 | ලි. ප. අ. 143/4517 සුසුකි වර්ගයේ යතුරු පැදිය<br>එන්ජින් අංකය : එෆ්. ආර්. 50-561985<br>චැසි අංකය : එෆ්. ආර්. 50-561762 |
| 04. | ඒ. ආර්. 527/2005 | ලි. ප. අ. 104-7410 යමහා වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : එෆ්. පයු. බී. 734945<br>එන්ජින් අංකය : එෆ්. පයු. බී. 734945 |
| 05. | ඒ. ආර්. 341/2006 | ලි. ප. නොකල හොණ්ඩා එක්ස්ප්‍රස් වර්ගයේ අබලන් යතුරුපැදිය<br>චැසි අංකය : ඒ. බී. 201034371<br>එන්ජින් අංකය : ඒ. බී. 07/ඊ-4034328 |
| 06. | ඒ. ආර්. 264/07 | ලි. ප. නොකල ඩබ්. පී. ජී. ඒ. 5497 හොන්ඩා වර්ගයේ යතුරුපැදිය<br>චැසි අංකය : 00 ජී 20 සී 06678<br>එන්ජින් අංකය : 00ජී 1811 - 06857 |
| 07. | | බජාජ් වර්ගයේ ලි. ප. නොකල අබලන් යතුරු පැදිය<br>චැසි අංකය : 16 සී 95 කේ 08650<br>එන්ජින් අංකය : 16 ඊ 95 ජේ – 98280 |
| 08. | ඒ. 122266/05 | ලියාපදිංචි නොකළ අබලන් සුසුකි වර්ගයේ යතුරු පැදිය<br>චැසි අංකය : බී. ඒ. 41 ඒ - 158812<br>එන්ජින් අංකය : 169441 |
| 09. | ඒ. ආර්. 289/06 | i. ජංගම දුරකථනය<br>ii. අංක 611276 දරන පාපැදිය |
| 10. | ඒ. ආර්. 146/07 | අංක 6 ඩී 05666 දරන පාපැදිය |
| 11. | ඒ. ආර්. 47/07 | අංක ඊ. වී. 1062 දරන ලුමාලා පාපැදිය |
| 12. | ඒ. ආර්. 109/07 | අංක එස්. 59 සී 13723 දරන පාපැදිය |
| 13. | ඒ. ආර්. 114/07 | අංක එස්. ඩී. 718016 වර්ගය අපැහැදිලි පාපැදිය |
| 14. | ඒ. ආර්. 220/07 | අංකය අපැහැදිලි වර්ගය නොදන්නා පා පැදිය |
| 15. | ඒ. ආර්. 490/06 | අංක 118306 දරන හීරෝ පාපැදිය |
| 16. | ඒ. ආර්. 489/06 | අංක 022-3302 දරන අබලන් පාපැදිය |
| 17. | ඒ. ආර්. 442/06 | i. අංක 55590469 දරන ලුමාලා පාපැදිය<br>ii. අංක කේ. 39346 දරන පාපැදිය<br>iii. අංකය අපැහැදිලි එවරස්ට් වර්ගයේ පා පැදිය<br>iv. අංක කේ. 441793 දරන හීරෝ වර්ගයේ පාපැදිය |

| | | |
|---|---|---|
| 18. | ඒ. ආර්. 443/06 | අංක 3 බී 003921 දරන හීරෝ වර්ගයේ පා පැදිය |
| 19. | ඒ. ආර්. 317/06 | අංක 55364170 දරන ලුමාලා පාපැදිය |
| 20. | ඒ. ආර්. 93/06 | අංක 3 පී 507100 දරන රෝමා වර්ගයේ පාපැදිය |
| 21. | ඒ. ආර්. 94/06 | අංක 001 ඒ 17 දරන ලුමාලා වර්ගයේ අබලන් පා පැදිය |
| 22. | නඩු අංක රහිත | වර්ගය අංකය නොමැති අබලන් පාපැදිය |
| 23. | නඩු අංක රහිත | වර්ගය අංකය නොමැති අබලන් පාපැදිය |
| 24. | නඩු අංක රහිත | ගැල්වනයිස් බාල්දි 01 |
| 25. | නඩු අංක රහිත | ඇලුමිනියම් කළගෙඩි 01යි |
| 26. | නඩු අංක රහිත | ඇලුමිනියම් මුට්ටි 01යි |
| 27. | 45777 | ලී ඉරුම් පට්ටල් 01යි |
| 28. | 45778 | ලී ඉරුම් පට්ටල් 01යි |
| 29. | 45697 | ලී ඉරුම් පට්ටල් 01යි |
| 30. | 45859 | ලී ඉරුම් පට්ටල් 01යි |
| 31. | නඩු අංක රහිත | හිස් බැරල් තොගයක් |
| 32. | නඩු අංක රහිත | හිස් කෑන් තොගයක් |
| 33. | ඒ. ආර්. 129/06 | වැලි පැටවීමට උපයෝගී කර ගන්නා සවල් 01යි. |

09-662

---

මගේ අංකය මහ/මැ/න.භා/වෙන්දේසි/2007.

## මහෙස්ත්‍රාත් අධිකරණය - මහනුවර 2007

### රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපෑ නඩු භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු අංකවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2007.09.29 වැනි දින පෙ. ව. 9.00 ට මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන සියලුම ද්‍රව්‍යයන් පිළිබඳ හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරිය වෙත ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවිට ඒ පිළිබඳව සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලැබ වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේ ම මුදල් ගෙවා එදිනම පස්වරු 4.00 ට පෙර එම ද්‍රව්‍ය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් බාර ගනු නොලැබේ.

06. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන සියලුම දෙනා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

07. උපලේඛනයට මෙයට අමුණා ඇත.

හර්ෂ සේතුංග,  
මහෙස්ත්‍රාත්,  
මහනුවර.

2007 අගෝස්තු මස 30 වැනි දින,  
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| *අනු අංකය* | *නඩු අංකය* | *නඩු භාණ්ඩය* |
|---|---|---|
| 01. | අංක රහිත | කුඩා 02 යි |
| 02. | එම | කුඩා 02 යි |
| 03. | එම | එම |
| 04. | එම | උදලු 05 යි |
| 05. | එම | උදලු 05 යි |
| 06. | එම | එම |
| 07. | එම | බාල්දි 02 යි |
| 08. | එම | එම |
| 09. | එම | එම |
| 10. | එම | චක්පිහි 10 යි |
| 11. | එම | එම |
| 12. | එම | එම |
| 13. | එම | එම |
| 14. | එම | එම |
| 15. | එම | මේස පිහි 10 යි |
| 16. | එම | එම |
| 17. | එම | එම |
| 18. | එම | එම |
| 19. | එම | එම |
| 20. | එම | එම |
| 21 | එම | පොරෝ 02 යි |
| 22. | එම | එම |
| 23. | එම | යකඩ ඉනි 05 යි |
| 24. | එම | එම |
| 25. | එම | එම |
| 26. | එම | එම |
| 27. | එම | කලය |
| 28. | එම | කලය |
| 29. | එම | මෝල් ගස් 02 යි |
| 30. | එම | එම |
| 31. | එම | බන්ඩි කියත් 02 යි |
| 32. | අංක රහිත | බන්ඩි කියත් 02 යි |
| 33. | එම | බන්ඩි කියත් 02 යි |
| 34. | එම | බන්ඩි කියත් 02 යි |
| 35. | එම | ඉරුම් කියත් 02 යි |
| 36. | එම | ඉරුම් කියත් 02 යි |
| 37. | එම | ඇලුමිනියම් මුට්ටි 01 යි |
| 38. | එම | කැති 05 යි |
| 39. | එම | කැති තල 05 යි |

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 40. | අංක රහිත | තාච්චි 03යි |
| 41. | එම | එම |
| 42. | එම | එම |
| 43. | එම | එම |
| 44. | එම | සවල් 05යි |
| 45. | එම | එම |
| 46. | එම | එම |
| 47. | එම | එම |
| 48. | එම | එම |
| 49. | එම | එම |
| 50. | එම | එම |
| 51. | එම | එම |
| 52. | එම | එම |
| 53. | 34323 | සවල් 01යි |
| 54. | 71627 | සවල් 01යි |
| 55. | 71628 | එම |
| 56. | 70622 | එම |
| 57. | 70618 | එම |
| 58. | 70621 | එම |
| 59. | 66877 | තරාදි 01යි |
| 60. | 66879 | එම |
| 61. | 34773 | එම |
| 62. | 34770 | එම |
| 63. | 34760 | එම |
| 64. | 34804 | එම |
| 65. | 34772 | එම |
| 66. | 34775 | එම |
| 67. | 34774 | එම |
| 68. | 99444 | එම |
| 69. | 91331 | එම |
| 70. | 34771 | එම |
| 71. | 78581 | එම |
| 72. | අංක රහිත | තරාදි 05යි |
| 73. | එම | එම |
| 74. | එම | එම |
| 75. | එම | එම |
| 76. | 74432 | රතු ලොකු කාපට් 01යි |
| 77. | 74819 | එම |
| 78. | 94241 | පොඩි කාපට් 01යි |
| 79. | අංක රහිත | කාපට් 03යි |
| 80. | 81578 | පැදුරු 01යි |
| 81 | අංක රහිත | හැවන් පැදුරු 03යි |
| 82. | එම | සින්තා පැදුරු 03යි |
| 83. | එම | චේන් බ්ලොක් ගල් 02යි දම්වැල් 02යි |
| 84. | එම | දම්වැල් කැබලි කිහිපයක්, කේබල් එකක්, චේන් බ්ලොක් එකක් |
| 85. | එම | වයර් තොගයක් |
| 86. | එම | කම්බි තොගයක් |
| 87. | ඒ ආර්. 906 | තඹ කම්බි තොගයක් |
| 88. | අංක රහිත | කළුපාට හෝස් එකයි |
| 89. | එම | සුදුපාට ජෝගුවක් |
| 90. | එම | යකඩ කැබලි තොගයක් |
| 91. | ඒආර් 88882 | ස්පීකර් 02යි |
| 92. | ඒආර් 88881 | ස්පීකර් 02යි |
| 93. | ඒආර් 88873 | ස්පීකර් 02යි |
| 94. | ඒආර් 88872 | ස්පීකර් 06යි |
| 95. | ඒආර් 88875 | ස්පීකර් 01යි, රිමෝට් 01යි |
| 96. | ඒආර් 88874 | කැසට් යන්ත්‍ර 01යි |
| 97. | ඒආර් 88876 | එම |
| 98. | ඒආර් 88880 | ස්පීකර් 02යි |
| 99. | ඒආර් 88879 | එම |
| 100. | ඒආර් 88877 | එම |
| 101. | ඒආර් 88878 | එම |
| 102. | ඒආර් 88620 | කැසට් යන්ත්‍ර 01යි |
| 103. | ඒආර් 88619 | එම |
| 104. | ඒආර් 88625 | එම |
| 105. | ඒආර් 88623 | එම |
| 106. | ඒආර් 88626 | එම |
| 107. | ඒආර් 88627 | කැසට් යන්ත්‍ර 02යි |
| 108. | ඒආර් 88621 | කැසට් යන්ත්‍ර 03යි |
| 109. | ඒආර් 88624 | එම |
| 110. | ඒආර් 88622 | කැසට් යන්ත්‍ර 02යි |
| 111. | ඒආර් 88618 | කැසට් යන්ත්‍ර 01යි |
| 112. | ඒආර් 88698 | විවිධ රෙදි අඩංගු පොහොර උර 01යි |
| 113. | ඒආර් 88695 | විවිධ රෙදි අඩංගු පොහොර උර 02යි |
| 114. | ඒආර් 88694 | විවිධ රෙදි අඩංගු පාර්සල් 01යි |
| 115. | ඒආර් 88699 | එම |
| 116. | ඒආර් 80024 | රූපවාහිනිය |
| 117. | ඒආර් 88697 | ටොයිස් බඩු අඩංගු පෙට්ටියක් |
| 118. | ඒආර් 88696 | ටොයිස් බඩු අඩංගු පාර්සලය |
| 119. | 14849 | කැසට් රෙකෝඩරය |
| 120. | 15837 | කැසට් යන්ත්‍රය |
| 121. | ඒආර් 79669 | පිත්තල ඉලක්තට්ටුවක් |
| 122. | ඒආර් 75936 | වෝල්ට් 12 බැටරියක් |
| 123. | 3080 | බිත්ති ඔරලෝසුව හා ගුවන් විදුලි යන්ත්‍රය |
| 124. | 17051 | කාර් රථයක රේඩියේටරය සහ වාහන බැටරිය |
| 125. | 3288 | විශ්කම්භය අඩි 2 1/2 රවුම් කියත අඩි 2 1/2 දිග අඩි 05 පළල යකඩ මේසය ෆාම් මාස්ටර් වර්ගයේ ලියාපදිංචි නොකළ අත් ට්‍රැක්ටරය |
| 126. | ඒආර් 88978 | රූපවාහිනිය |
| 127. | ඒආර් 88979 | මේස විදුලි පංකාව |
| 128. | ඒආර් 88928 | ජංගම දුරකථනය |
| 129. | ඒආර් 79335 | ජංගම දුරකථනය |
| 130. | ඒආර් 79901 | ජංගම දුරකථනය |
| 131. | 88930 | ජෙනරේටරය |
| 132. | ඒආර් 89548 | රෙදි අඩංගු මල්ල |
| 133. | අංක රහිත | කැත් 10යි |
| 134. | එම | එම |
| 135. | එම | එම |
| 136. | එම | එම |
| 137. | එම | එම |
| 138. | එම | එම |
| 139. | එම | එම |

| අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය | අනු අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|---|---|---|
| 140. | අංක රහිත | කෑන් 10යි | 181 | අංක රහිත | එම |
| 141 | එම | එම | 182. | ඒආර් 89266 | පාපැදිය |
| 142. | එම | එම | 183. | ඒආර්. 88981 | එම |
| 143. | එම | එම | 184. | ඒආර්. 88125 | එම |
| 144. | එම | එම | 185. | 4096 | එම |
| 145. | එම | එම | 186. | 98801 | එම |
| 146. | එම | එම | 187. | 98802 | එම |
| 147. | එම | එම | 188. | අංක රහිත | එම |
| 148. | එම | එම | 189. | අංක රහිත | එම |
| 149. | එම | එම | 190. | අංක රහිත | එම |
| 150. | එම | එම | 191. | අංක රහිත | එම |
| 151. | එම | එම | 192. | අංක රහිත | එම |
| 152. | එම | එම | 193. | අංක රහිත | එම |
| 153. | ඒ. ආර්. 79668 | ගෑස් සිලින්ඩර් 01යි | 194. | අංක රහිත | එම |
| 154. | ඒ. ආර්. 79667 | එම | 195. | අංක රහිත | එම |
| 155. | අංක රහිත | එම | 196. | අංක රහිත | එම |
| 156. | එම | එම | 197. | අංක රහිත | එම |
| 157. | එම | එම | 198. | අංක රහිත | එම |
| 158. | එම | එම | 199 | අංක රහිත | එම |
| 159. | එම | එම | 200. | අංක රහිත | එම |
| 160. | එම | එම | 201. | අංක රහිත | එම |
| 161. | එම | එම | 202. | අංක රහිත | එම |
| 162. | එම | එම | 203. | අංක රහිත | එම |
| 163. | එම | එම | 204. | අංක රහිත | එම |
| 164. | එම | එම | 205. | අංක රහිත | එම |
| 165. | එම | වතුර බට කීපයක් | 206. | අංක රහිත | එම |
| 167. | 73112 | උළුවහු 01 හා ජනෙල් 02 යි | 207. | අංක රහිත | එම |
| 168. | 65547 | ලී පුටු 02 යි | 208. | අංක රහිත | එම |
| 169. | අංක රහිත | යකඩ බට 01යි | 209. | අංක රහිත | එම |
| 170. | අංක රහිත | යකඩ බට 01යි | 210. | අංක රහිත | එම |
| 171. | අංක රහිත | යකඩ බට 01යි | 211. | අංක රහිත | එම |
| 172. | අංක රහිත | යකඩ බට 01යි | 212. | අංක රහිත | එම |
| 173 | අංක රහිත | යකඩ බට 01යි | 213. | අංක රහිත | එම |
| 174. | අංක රහිත | කම්බි කුරු තොගයක් | 214. | අංක රහිත | එම |
| 175. | අංක රහිත | 1/4 කම්බිකුරු තොගයක් | 215. | අංක රහිත | එම |
| 176. | අංක රහිත | වැලි බැකෝ 01යි | 216. | අංක රහිත | එම |
| 177. | අංක රහිත | එම | 217. | අංක රහිත | එම |
| 178. | අංක රහිත | එම | 218. | අංක රහිත | එම |
| 179. | අංක රහිත | එම | | | |
| 180. | අංක රහිත | එම | | | |

09-676

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි ජේදයට අනුව පහත නම් සඳහන් සමාගම නිත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව දන්වමු.

සමාගමේ නම : සේෆ්ටි ෆස්ට් ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගමේ අංකය : පී. වී. 60605
ලියාපදිංචි ලිපිනය : අංක 524, දෙවැනි මහල, මරදාන පාර, කොළඹ 10.

ලැමියර් ඇන්ඩ් ලැමියර් කෝපරේට් කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්,

අණ පරිදි,
සෙක්‍රටරීස්.

අංක 12, ෆයිප් රෝඩ්, කොළඹ 05.
දුරකථන අංකය : 2594235

09-841

## ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ, 9 වැනි ජේදයට අනුව සමාගමක් නිත්‍යානුකූල ලෙස ලියාපදිංචි කිරීම පිළිබඳව පහත සඳහන් ලෙස ප්‍රකාශයට පත් කර සිටිමි.

සමාගමේ නම : බයිනරි සිස්ටම්ස් (පුද්ගලික) සමාගම,
සමාගමේ අංකය : පී. වී. 60047
ලියාපදිංචි කළ ලිපිනය : අංක 21ඒ, කොරි රෝඩ්, වැල්ලවත්ත, හික්කඩුව.

අණ පරිදි,
ලැමීර් ඇන් ලැමීර් කෝපරේට් කන්සල්ටන්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්,
ලේකම්කරු,
අංක 12, ෆයිෆ් රෝඩ්, කොළඹ 05.

දුරකථන අංකය : 2594235

09-842

## දැන්වීමයි

2007 අංක 7 දරන නව සමාගම් පනතේ, 9 (1) වගන්තියේ විධි විධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : අයි. ටී. මාර්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ අංකය : පී. වී. 60963
ලියාපදිංචි දිනය : 2007.08.09
ලියාපදිංචි කළ ලිපිනය : අංක 501 එෆ්, තෙවන මහල, යුනිටිප්ලාසා, කොළඹ 04

ලේකම්,
සී. වී. අමරසිංහ,

අංක 61/49, අඹවත්ත පාර, බොරලැස්ගමුව.

09-829

## සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ප්‍රියදර්ශන ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්,
සංස්ථාගත කිරීමේ දිනය : 2007.08.21
ලියාපදිංචි කාර්යාලය : අංක 286, කච්චේරි හන්දිය, මොණරාගල
සංස්ථාගත අංකය : පී. වී. 61104

සී අයි බී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2007 සැප්තැම්බර් මස 05 වැනි දින.

09-814/1

## සමාගමක් සංස්ථාපනය කිරීමේ ප්‍රසිද්ධ දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ඒසියන් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සංස්ථාගත කිරීමේ දිනය : 2007.08.15
ලියාපදිංචි කාර්යාලය : අංක 05, පහළ රජ මාවත, බදුල්ල
සංස්ථාගත අංකය : පී. වී. 61030

සී අයි බී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2007 සැප්තැම්බර් මස 05 වැනි දින.

09-814/2

## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

පී. ජේ. ඉම්පෙක්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පී. ජේ. ඉම්පෙක්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 490/3, ලයනල් මිවෙල් මාවත, කිරිබත්ගොඩ
ලියාපදිංචි අංකය : පීවී 60836

09-779

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : රෝයල් බ්‍රිජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 61105
සංස්ථාගත කළ දිනය : 2007 අගෝස්තු මස 21
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 278, හිල් වීදිය, දෙහිවල.

අරුණ ශාමන් ලියනගම- අධ්‍යක්ෂ.

09-787

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

එංගලන්තය, බී 73 6 ජේ ඩී, සටන් - කෝල්ෆීල්, සමර්විල් රෝඩ්, අංක 11 හි සහ දැනට ශ්‍රී ලංකාවේ, කොළඹ 05, ෆයිස් පාරේ, අංක 49/12, හි පදිංචි සෙලින් අමෙලා මනෝරි ගුණවර්ධන (විවාහයට පෙර ද සිල්වා) වන මම මහජනයාට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට දන්වා සිටින වගනම්, ශීලා ද සිල්වා යන අයට බලය පවරන ලද ප්‍රසිද්ධ නොතාරිස් එච්. අයි. සෙනෙවිරත්න විසින් ලියා සහතික කරන ලද අංක 136 හා 2006 අගෝස්තු මස 24 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය අද දින සිට එනම්, 2007 අගෝස්තු 27 වැනි දින සිට අවලංගු සහ බල රහිත වන බව ද ඇය විසින් ඇතුලත් වනු ලබන කිසිදු ගණුදෙනුවක බලපැවැත්මක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

සෙලින් අමෙලා මනෝරි ගුණවර්ධන,
(විවාහයට පෙර ද සිල්වා.)

09-719

## දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 වැනි ඡේදයට අනුව, පහත නම් සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම: සීමාසහිත ලොජිස්ටික්ස් ටර්මිනල්ස් පෞද්ගලික සමාගම
සමාගම් අංකය: පී. වී. 60718
ලියාපදිංචි කරන ලද කාර්යාලයේ ලිපිනය: **D**/3/1/2, ටොරින්ටන් චතුරශ්‍රය, අදියර III, ලොන්ඩන් පෙදෙස, කොළඹ 7
ලියාපදිංචි කළ දිනය: 2007 ජූලි 25 දින.

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

09-866

## නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාර පහත දක්වා ඇති සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව අපි මෙසේ දැනුම් දී සිටිමු.

සමාගමේ නම: නාගහදෙනිය (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය: පී. වී. 60912
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය: 56, දකුණු බැද්දගාන පාර, පිටකෝට්ටේ, කෝට්ටේ
සංස්ථාගත කරන ලද දිනය: 2007 අගෝස්තු 06

අධ්‍යක්ෂ : R. A. L. C. පෙරේරා.

09-864

## දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 09 වැනි ඡේදයට අනුව පහත නම් සඳහන් සමාගම නීත්‍යානුකූල සමාගමක් ලෙස ලියාපදිංචි කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම: සීමාසහිත රෙල්වෝ ලංකා (පෞද්ගලික) සමාගම,
සමාගමේ අංකය: පී. වී. 60810
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය: අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
ලියාපදිංචි කළ දිනය: 2007 ජූලි 27 දින.

සමාගම් ලේකම්වරු,
කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

09-865

## දැන්වීම

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ නම: සොනිකිමා ජැපනීස් ලැන්වේජ් සෙන්ටර් ප්‍රයිවට් ලිමිටඩ්
සමාගමේ අංකය: පී. වී. 61156
ලියාපදිංචි දිනය: 2007 අගෝස්තු මස 24 දින
ලියාපදිංචි කාර්යාලය :අංක 331, විශාරද මාලනී බුලත්සිංහල මාවත, බොරලැස්ගමුව.

09-889

## දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම: M. M. S. M. හාඩ්වෙයාර්
ලියාපදිංචි අංකය: පී. වී. 60911
ලියාපදිංචි ලිපිනය : 119/ **A**, මහ වීදිය, කුරුණෑගල
ලියාපදිංචි දිනය: 2007 අගෝස්තු මස 06 දින.

අධ්‍යක්ෂ : M. Y. A. ඉෂාක්.

09-890

---

## 2007 අංක 07 දරන සමාගම් පනත

සයුරි නිව්ස්පේපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

**පීවී 61191**

ඉහත සඳහන් සමාගම 2007 අගෝස්තු මස විසිනම (29) වන දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය 178 1/2, පරණ කොට්ටාව පාර, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමු.

ලීගල් ඇන්ඩ් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,
192, අළුත්කඩේ වීදිය,
කොළඹ 12.

2007 සැප්තැම්බර් මස 03 දින දී ය.

09-760

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

තිස්සමහාරාම, කම්බිවත්ත, දෙබරවැව හි පදිංචි සුවඳහැන්නදිගේ කුසුමා, එම ලිපිනයේ පදිංචි මහමඩකලපුවගේ වානිකා චාන්දනී, මහමඩකලපුවගේ නදීෂා ශිරෝමනී, මහමඩකලපුවගේ ඉනෝකා ප්‍රියදර්ශනී, තංගල්ල, දංකැටිය පාරේ, අංක 21/11 හි පදිංචි මහමඩකලපුවගේ පොඩිනෝනා, ගන්දර, උස්වත්තේ පදිංචි මහමඩකලපුවගේ සෝමාවතී, රන්න, වැල්ලඹඩේ පදිංචි මහමඩකලපුවගේ ගුණපාල (මියගොස්) ද වන අපි, තංගල්ල නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඊ. මුණසිංහ මහත්මිය විසින් වර්ෂ 2004.08.15 දින ලියා සහතික කරන ලද අංක 2367 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තංගල්ල, දංකැටිය පාරේ අංක 5 දරන ස්ථානයේ පදිංචි බදුගේ පියල් චන්ද්‍රනාත් ද සිල්වා යන අයට පවරන ලද ඇටෝර්නි බලය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසිකොට අවලංගු කරනු ලැබේ. එකී ඇටෝර්නි බලකරු විසින් මින් ඉදිරියට අපගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම කටයුත්තක් අප විසින් වග කියනු නොලැබේ.

1. සුවඳහැන්නදිගේ කුසුමා,
2. මහමඩකලපුවගේ වානිකා චාන්දනී,
3. මහමඩකලපුවගේ නදීෂා ශිරෝමනී,
4. මහමඩකලපුවගේ ඉනෝකා ප්‍රියදර්ශනී,
5. මහමඩකලපුවගේ පොඩිනෝනා,
6. මහමඩකලපුවගේ සෝමාවතී,
7. මහමඩකලපුවගේ ගුණපාල (මියගොස්).

09-612

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

කොළඹ කොටුවෙන් පර්චස් 36.492ක් සහ අගනා ගොඩනැගිල්ලක්

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සහා සීමාව ඇතුළත වූ කොටුවේ බේලි වීදියේ පිහිටියාවූ ද, මිනින්දෝරු නහා මට්ටම්කරු බෙන් ජේ. නෙයිඩමන් විසින් සම්පාදිත 1937 පෙබරවාරි මස 18 දාතම හා අංක 8158 දරන පිඹුර ප්‍රකාර, උතුරට: ජේ. එම්. රොබට්සන් සහ සමාගමේ මහත්වරුන්ගේ දේපළ ද, නැගෙනහිරට: පටුමගක් ද, දකුණට: බේලි වීදිය ද සහ බස්නාහිරට: මහ තැපැල් කාර්යාලයේ (රජයේ ඉඩම) මායිම් වන්නාවූ ද, පර්චස් තිස් එකකුත් දශම හතරයි නමයයි දෙකක (අ. 0, රූ. 0, පර්චස් 31.492) බිම් ප්‍රමාණයකින් සමන්විත වන්නාවූ දැනට තනි දේපළක් වශයෙන් පවතින්නාවූ බිම් කොටස් දෙකක සියල්ලම, ඒ මත පිහිටියාවූ (කලින් වරිපනම් අංක 1 හා පසුව අංක 9, 11 හා 13 දැරුවා වූ සහ) දැනට වරිපනම් අංක 7, 9, 11,13 සහ 13 ඒ දරන්නාවූ ගොඩනැගිලි සමග වන්නේ ය. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ඒ 456/296 දරන හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තාවූ ද ඉඩම වේ.

එක්සත් ජනපද ඩොලර් දහතුන් ලක්ෂ තිස් අට දහස් දෙසිය හතලිස් අටයි දශම තුනයි හත (13,38,248.37) මුදල, 2004 ක් වූ මාර්තු මස 26 වැනි දින පටන් පූර්ණ මුදල ගෙවන තුරු වර්ෂයකට සියයට එකයි දශම අටයි හයක් (1.86%) (ලන්ඩනයේ බැංකු අතර අර්පණ අනුපාතය (LIBOR අනුව) බැගින් සහ එක් වර්ෂයකට සියයට 3% බැගින් වූ අනුපාතය අනුව එක්සත් ජනපද ඩොලර් 1,100,287.65ක් සඳහා තවදුරටත් වූ පොළිය ද, සමග සහ/හෝ මුදල් ගෙවනු ලබන අවස්ථාවේ දී ශ්‍රී ලංකා රුපියල්වලින් එකී මුදලේ සමකය ද, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු අයකර ගැනීම

සඳහා මෙහි උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ කොළඹ 11, මහ වීදියේ, අංක 265 දරන ස්ථානයේ පිහිටා ඇති, 1) මැකී ඉන්ඩස්ට්‍රීස් එක්ස්පෝට්ස් ලිමිටඩ් සහ 2) මැකී ප්‍රොපර්ටි ඩිවලොපර්ස් (පීවීටී) ලිමිටඩ් යන ආයතනයන්ට විරුද්ධව, කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ, අංක 21 දරන ස්ථානයේ පිහිටා ඇති කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් ලිමිටඩ් යන ආයතනය විසින් වාණිජ හා සිවිල් අධිකරණ බලය පාවිච්චි කරමින් (කොළඹ නඩු විභාග කරන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ අංක එච්. සී. (සිවිල්) 247/2004 (1) දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම් මත පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 12 වැනි දින පෙරවරු 10.30 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,000, (6) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,000ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත වාණිජ හා සිවිල් අධිකරණ බලය පාවිච්චි කරමින් (කොළඹ නඩු විභාග කරන) බස්නාහිර පළාතේ මහාධිකරණයේ අංක එච්. සී. (සිවිල්) 247/2004 (1) දරන මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සහ අදාළ ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 12, හල්ස්ඩෝර්ෆ් වීදියේ, අංක 142 දරන ස්ථානයේ පිහිටි නීතිඥවරුන් වන ජුලියස් ඇන්ඩ් ක්‍රීසි සමාගමෙන් විමසන්න. දුරකථන අංක: 4617312, 2435387.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංකය: 2873656, ෆැක්ස් අංකය :2871184 ජංගම: 0777-672082.

09-853

---

## නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී.

සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### රාගම නගරයට ආසන්නව තේවත්ත පාරේ පදිංචියට සුදුසු දේපළක්

මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ කැන්දලියද්දපාලුව ගමේ පිහිටි දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන්කරන ලද ලොට් 7 ඒ ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 34.

මෙම දේපළ රාගම පදිංචි ලක්සිරි පාලිත අබේරත්න කොඩිතුවක්කු ණයකරු ලෙසට නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.08.10 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2007.07.27 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.–* රාගම නගරයේ සිට තේවත්ත පාරේ තේවත්ත පල්ලිය හන්දිය පසුකර ගල්වල හන්දිය දෙසට කි. මී. 1.5ක් පමණ ගියවිට මෙම මාර්ගයේ වම් දෙසින් අදාළ දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.–* විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ක (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : කළමනාකාරතැන (නීති), නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී. එල්. සී., අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011-2437701 - 10.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංක :081-2211025, 071-4755974, ෆැක්ස් අංකය: 081-2211025.

09-854/2

---

## සෙලාන් බැංකුව - හෝමාගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

### පදිංචියට ඉතා වටිනා දේපළක්

මහරගම නගර සභා සීමාවන් තුළ රුක්මලේ ගමේ පිහිටි "ගොරකගහවත්ත" නමැති ඉඩමෙන් බෙදූ කොටසක් හා එහි තුළ පිහිටි නිවස ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 35.15.

මෙම දේපළ පන්නිපිටිය පදිංචි රණසිංහ ආරච්චිගේ අජන්තා යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2007 ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.09.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2006.05.01 වැනි දින ලංකාදීප, ඩේලිමිරර් හා 2006.04.25 වැනි දින වීරකේසරී පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*– කොට්ටාව මන්සන්ධියේ සිට අතුරුගිරිය පාරට පිවිස නාගහ හන්දිය දක්වා ගමන්ගෙන දකුණට හැරී නාගහ පාරට ඇතුළු වී වම් දෙසට මීටර් 250ක් පමණ ගමන් ගත්විට මෙම පාරේ දකුණු දෙසින් පාරට මායිම්ව අදාළ දේපළ පිහිටා තිබේ.

*ගෙවීමේ ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු වේ. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), ප්‍රාදේශීය සභා බදු සඳහා 01% (සියයට එකයි), වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% ක (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, සියලුම ප්‍රචාරක වියදම් ද, ගැනුම් මිලෙන් ඉතිරි 90% (සියයට අනූවක්) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී සෙලාන් බැංකුවට ගෙවා නිමකළ යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න :සහකාර සාමාන්‍යාධිකාරී (දේපළ අංශය), සෙලාන් බැංකුව පී. එල්. සී, සෙලින්කෝ සෙලාන් ටවර් ගොඩනැගිල්ල, අංක 90, ගාලුපාර, කොළඹ 03.

දුරකථන අංක : 011-4701256, 011 - 2456258, 077- 7736452.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංක :081-2211025, 071-4755974, ෆැක්ස් අංකය :081-2211025.

09-854/3

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - කල්මුනේ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කල්මුනේ ප්‍රසිද්ධ නොතාරිස් එම්. යූ. ටී. සේයිනුදීන් විසින් සහතික කරන ලද්දා වූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ 2005.04.06 සහ 2005.07.20 දින සහ පිළිවෙලින් අංක 10829 සහ 10877 දරන බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අබ්දුල් රෂික් මොහොමඩ් රෂීම් යන අය ණයකරු හැටිය ද සහ ද සලීම් ෆහිමා ණයකරු සහ උකස්කරු හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාර පහත සඳහන් දේපළ පිහිටි ස්ථානයේ දී 2007 ඔක්තෝබර් මස 09 වැනි දින පෙ. ව. 11.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, සමන්තුරේ ප්‍රාදේශීය සභා සීමාව තුළ පිහිටි සමන්තුරේ තුන්වන කොට්ඨාසයේ පිහිටි දහවන පාරේ, බසාර් හි පිහිටි වරිපනම් අංක 8 දරන ඉඩම සහ නිවස, ලිඳ ආදී සියලු දේත් සමග. විශාලත්වය : පර්චස් 10.77යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.03.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* සහ 2007.05.23 වැනි දිනැති අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

01. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියක් (රු. 500)ද,
05. සියලුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂා සහ වෙනත් තොරතුරු සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 479 දරන ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන කළමණාකරු (ණය අයකිරීම්), දුරකථන අංක 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු.

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාලය සංකීර්ණය, කොළඹ 12.

09-813

---

### සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - පොලොන්නරුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

පොලොන්නරුව ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. හරිස්චන්ද්‍ර විසින් සහතික කරන ලද්දා වූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 2005.10.06 දින සහ අංක 2302 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ශ්‍රී බුවනෙකබාහු දේවනාරායන් මුලචිත්‍රා ගෙදර දන්තනාරායන සහ අමර සෙනරත් යාපා ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2007 ඔක්තෝබර් මස 11 වැනි දින පෙ.ව. 11 ට ඇරඹෙන පරිදි දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උතුරු මැද පළාතේ, තමංකඩුව, තමංකඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ, තෝපා වැව, තුලානේ, පිහිටි මිනිපිටියකැලේ, නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක අයි. කොටඹගේ විසින් මැන සාදන ලද 2004.05.15 දිනැති අංක 1506 දරන පිඹුරේ ලොට් ඒ ලෙස සළකුණු කර බෙදා වෙන් කරන ලද ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමග වේ.

විශාලත්වය : පර්චස් 10.2යි.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.06.29 වැනි දින රජයේ ගැසට් පත්‍රය සහ 2007.08.13 වැනි දිනැති අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

01. ගැණුම් මුදලින් සියයට දහයක් (10%) ද,
02. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ද,
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකහමාරක් (2.5%) ද,
04. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සියයක් (රු. 500)ද,
05. සියලුම ප්‍රචාරක වියදම්,
06. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහක් (රු. 2,000)ද වේ.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල් නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අදාළ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමනාකරු (ණය අයකිරීම්), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංක: 2661815, 2661816 ගෙන් ලබාගත හැක.

එන්. එච්. පී. එෆ්. ආරියරත්න,
උසාවි කොමසාරිස් හා බලයලත් වෙන්දේසිකරු,

අංක 34/31 සහ 32,
නීතිඥ කාර්යාල සංකීර්ණය, කොළඹ 12.

09-815

---

## ඩීඑෆ්සීසී බැංකුව

(කලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන මූල්‍ය සංස්ථාව යනුවෙන් හඳුන්වන ලද)

### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ විකිණීම

**අංක 7475 ඇපකරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

කළුතර දිස්ත්‍රික්කයෙහි, කළුතර තොටමුණේ උතුරේ, කළුතර බැද්දෙහි නාගොඩ පිහිටියාවූ, බලයලත් මිනින්දෝරු එම්. ජේ. සේතුංග මහතා විසින් සකසන ලද 1969.07.31 දාතමින් යුතු අංක 550 පිඹුරු පතෙහි දක්වන ලද පිටගොනෙලිය *හෙවත්* ඕර්නත් වත්ත ලෙස හඳුන්වනු ලබන ඉඩමේ ලොට් අංක 66 ලෙස සලකුණු කරන ලද සහ වෙන් කරන ලද සියල්ල ඉඩමේ ප්‍රමාණය : පර්. 20, ගොඩනැගිලි සහිත සියල්ල කළුතර ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඒ. පුංචිහේවා මහතා විසින් සහතික කරන ලද 2005.03.18 දිනැති, අංක 7475 උකස්කරය ප්‍රකාර ඩී. එෆ්. සී. සී. බැංකුවට උකස් කරන ලදුව, කළුතර "දර්ශන" ආයතනයේ පූර්ණ හිමිකරු ලෙස ක්‍රියා කරන බමුණුසිංහ ආරච්චිගේ මිසාන්ත පෙරේරා විසින් ගෙවීම්වල පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපොළ, ඩීඑෆ්සීසී බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2007 ඔක්තෝබර් මස 11 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙරවරු 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* – මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 25,000 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩීඑෆ්සීසී බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අමතන්න.
දුරකථන අංකය : 011-2442442.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ISO 9001 : 2000 සහතික ලත්, ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ, උපදේශක තක්සේරුකරුවෝ
සහ ඉඩම් අලෙවි නියෝජිතයෝ.

*ප්‍රධාන කාර්යාලය* :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081-2227593,
දුරකථන/ෆැක්ස් : 081-2224371,
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය* :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංකය : 2588176,
ඊමේල් : schokman@samera1892.com

09-836

## මහජන බැංකුව –අම්බලන්තොට ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුනම පිහිටි සියඹලාගහවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කරන ලද අංක 01 දරන රූඩ් දෙකයි, පර්චස් එකක් (අක්. 00, රූ. 02, පර්.01) විශාල ඉඩම සියළු වැවිලි හා ගොඩනැගිලි ද සමඟ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින්, 2007.10.10 වන දින පෙ. ව. 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ, දේපළ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2000.04.14 දින ද, " දිනමිණ", " ඩේලිනිව්ස් "සහ " තිනකරන් "පුවත්පත්වල 2002.07.17 දින ද, පළ කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.*- අම්බලන්තොට සිට තංගල්ල පාරේ සැතපුම් 04ක් පමණ ගමන් කළ විට හමුවන ලුනම ග්‍රාමයේ පාරට යාබදව මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය :

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත මහජන බැංකුව, හම්බන්තොට ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකාර මහතාට ගෙවිය යුතුය.

දුරකථන අංක : 047-2220901 2220903, 2222282,
ෆැක්ස් අංකය : 047-2220900.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර,
දුරකථන අංකය : 041–2228731.

09-867

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය: කේ/4/2973/කේවයි2/860.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2006.07.07 දින *ගැසට් පත්‍රයේ* සහ 2006.08.21 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොලිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, කටුගස්තොට, කහල්ල, අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2007.10.20 වැනි දින පස්වරු 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙල්ගල ග්‍රාමයේ පිහිටි ගොඩඉඩම නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කුමාරසාමි විසින් 1998.03.20 දිනැති හා අංක 10627 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්.0 ක්වූ, බෙදා වෙන් කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමඟ වේ.

මෙය මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක එල්.ඩී.ඕ. එන්/13/25/97 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2007 සැප්තැම්බර් මස 07 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 3.

09-861/1

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය: කේ/4/5358/කේවයි3/795.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය

විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ 2005.09.09 දින *ගැසට් පත්‍රයේ* සහ 2005.11.14 වැනිදා දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව, ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය කටුගස්තොට, කහල්ල අංක 26 බී හි බලයලත් වෙන්දේසිකාර කේ. බී. දහම්පත් මහතා විසින් එම දේපල පිහිටි ස්ථානයේ දී 2007 ඔක්තෝබර් මස 20 වැනි දින පෙරවරු 10.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය සභා සීමාව තුළ උනම්බුව පිහිටි නාරංගෙහේන පසුව නාරන්ගෙවත්ත සහ වර්තමානයේ සන්ෂයින් ගාර්ඩින් ලෙස හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඊ. එස්. එල්. රාජකරුණා විසින් 2000.12.01 වැනි දින සහ 05 වැනි දින මනින ලද හා 2000.12.10 වැනි දින කැබලි කිරීමෙන් සාදන ලද අක 600 දරන පිඹුරේ කැබලි අංක 25 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 12 ක් වූ බෙදා වෙන්කළ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

තවද, එකී පිඹුරු අංක 600 හි දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

මෙය ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක සී 184/216 හි ලියාපදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 3,
2007 සැප්තැම්බර් මස 07 වැනි දින.

09-861/2

---

### මහජන බැංකුව –කොට්ටාව ශාඛාව

#### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම නගර සභා සීමාව තුළ රුක්මලේ ගමේ පිහිටි දෙල්ගහවත්ත, සම්බුද්දිගොඩපොරගහවත්ත නමැති අංක 3786 සහ 2003 දරන පිඹුරේ සඳහන් (අක්. 0, රූඩ්. 0, පර්. 20) විශාල බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ සමඟ මීටර් 6 සිට 5 දක්වා පළල පාර වශයෙන් අංක 8458 පිඹුරෙන් වෙන් කර ඇති මාර්ග ප්‍රවේශ අයිතිය ද මීට ඇතුළත් වේ. ඒ අනුව පර්චස් විසිහතර (අක්. 0, රූ. 0, පර්. 24) ක් විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2007 ඔක්තෝබර් මස 09 දින 10.30ට පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2007.06.29 *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2007.08.16 දිනැති, ඩේලිනිව්ස් සහ දිනමිණ, පුවත්පත් බලන්න.

*දේපලට පිවිසීම*.- කොට්ටාව නගරයේ සිට අතුරුගිරිය පාරේ මීටර් 900ක් ගොස් අහහරුවාදා පොල හන්දියෙන් වම් පැත්තට ඇති මාලඹේ පාරේ හතර මංසන්ධිය දක්වා ගොස් දකුණු දෙසට ඇති බාලිකා නිවාස පාරේ මීටර් 250ක් ගියපසු වම් පසට ඇති පාරේ මීටර් 50ක් ගිය පසු මෙම දේපලට, ළඟා විය හැක.

*ගෙවීමේ ක්‍රමය*.– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පලාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක්,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500 ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වේනොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත නුගේගොඩ, ස්ටැන්ලි තිලකරත්න මාවතේ, අංක 102 මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ කලාපීය ජොෂ්ඨ කළමනාකාර බටහිර කලාප II වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංකය: 2811007, 2825101, 854189
ෆැක්ස් අංකය: 768018

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
සාමවිනිසුරු මහාධිකරණ සහ දිසා අධිකරණ
උසාවි කොමසාරිස්,වෙන්දේසිකරු, තක්සේරුකරු
සහ භාෂා පරිවර්තක.

දුරකථන අංකය : 2810145, 0777-212602,
අංක 03, පාගොඩ පාර,
නුගේගොඩ.

09-874

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - විදේශීය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේපත්තු සල්පිටි කෝරලේ කොළඹ මහ නගර සභා සීමාව තුළ කිරුළපන අංක 44 ඡන්ද කොට්ඨාසයේ දෙල්ගහවත්ත ඉඩමේ ලොට් සී 2 බී වෙතින් නැවත බෙදන ලද (ඉතිරි කොටස) පර්චස් විසි දෙකයි දශම දෙකයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 22.22) විශාලත්වයෙන් යුත් ඉඩම් කොටස වේ.

කොළඹ 06, හයිලෙවල් පාර, අංක 309 හි "කොණ්ඩා ටුවර්ස් " යන නාමය අභිධානය සහ විලාශයෙන් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නිහාල් සරත් කොන්ද්‍රුස් ද අල්විස් සහ ස්වර්ණා ද අල්විස් යන අය විසින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද්දකි.

එම දේපළ, වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 16 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී, මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2001.08.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද,* ලංකාදීප, තිනකරන් සහ අයිලන්ඩ් පත්‍ර ද, විකුණුම් දැන්වීම් සඳහා 2007.09.21 වැනි දින *රජයේ ගැසට් පත්‍රය ද,* 2007.09.24 වැනි දින දිවයින, සහ අයිලන්ඩ් පුවත් පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම.–* කොළඹ කොටුවේ සිට හයිලෙවල් පාරේ සැතපුම් 5 1/4 ක දුර ප්‍රමාණයක් කිරුළපන මංසන්ධිය දෙසට ගොස් කිරුළපන මංසන්ධිය පසුකොට යාර 500-600ක් පමණ ඉදිරියට යනවිට කිරුළපන සහ නුගේගොඩ මංසන්ධි අතරේ ඇති කි. මී. 9 කණුව පසුකොට යාර කිහිපයක් ඉදිරියට ගිය විට කොළඹ ප්‍රධාන හයිලෙවල් පාරට මායිම්ව මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* – විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිළෙන් සියයට දහයක් 10%,
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකක් (01%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2,000,
5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ විදේශීය ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක-සාම විනිසුරු බලයලත්
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු සහ
උසාවි කොමසාරිස්, කොළඹ වාණිජ මහාධිකරණ
සහ දිසා අධිකරණය, බලයලත් වෙන්දේසිකරු,
රාජ්‍ය බැංකු සහ වාණිජ බැංකු.
අංක 99, උසාවි පාර,
කොළඹ 12.
දුරකථන සහ ෆැක්ස් අංකය : 2445393.

ප්‍රධාන කළමණාකරු, ණය අයකර ගැනීම,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමටඩ්,
අංක 21, බ්‍රිස්ටල් වීදිය,
කොළඹ 01.
දුරකථන අංක : 2448163, 2347717 සහ 2447167
ෆැක්ස් අංකය : 2347717.

09-872

---

## සෙලාන් බැංකුව පී එල් සී - විදේශ මුදල් බැංකු ඒකකය

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, දාසිය පත්තුවේ ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ කටුනායක සීදූව උප කාර්යාල සීමාව තුළ දකුණු කදිරාන ග්‍රාමයේ පිහිටි "කදිරානවත්ත" නමැති ඉඩම/ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද 1985 ජූලි 12 දාතම හා අංක 1230 දරන පිඹුරේ ලොට් 1 සහ ලොට් 2 වශයෙන් ලකුණු කොට ඇති (මහ කොළඹ ආර්ථික කොමිසම කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අදියර 1 සැකසුම් පිඹුරේ නිරූපිත චිත්‍ර සැලසුම් අංක GCEC/IPZ/K/003 හි ලොට් CMIL වශයෙන් දැක්වෙන ඉඩමේ ප්‍රතිමිනුමක් හා උපබෙදුමක් වන) සම්පූර්ණ ඉඩම්වල බදු අයිතිය.

ප්‍රමාණයෙන් ලොට් 1, අක්. 10 - රූඩ් 2 පර්. 10.2 සහ ලොට් 2 -අක්. 0 රූඩ් 3, පර්. 13 ක ඉඩම් සහ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දාසිය පත්තුවේ ගම්පහ දිස්ත්‍රික් සංවර්ධන සභාවේ කටුනායක සීදූව උපකාර්යාල සීමාව තුළ කදිරාන ග්‍රාමයේ පිහිටි "කදිරානවත්ත" නමැති ඉඩමට/ඉඩමෙන් බලයලත් මිනින්දෝරු පී. සින්නම්බි විසින් සාදන ලද 1985 ජූලි 12 දාතම හා අංක 1230 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කොට ඇති (මහකොළඹ

ආර්ථික කොමිසම, කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අදියර 1 සැකසුම් පිඹුරේ නිරූපිත චිත්‍ර සැලසුම් අංක GCEC/IPZ/K/003 හි ලොට් CMIL වශයෙන් දැක්වෙන ඉඩමේ ප්‍රතිමිනුමක් හා උපබෙදුමක් වන) සම්පූර්ණ බිම් කොටස උඩින්, යටින් හා ඔස්සේ මාර්ග අයිතිය පිළිබඳ පූර්ණ නිදහස් අයිතිය, නිදහස හා බලපත්‍රය හා භාවිතා කරන අයගේ අනෙකුත් සියලුම අයිතීන් සමග සහ පහත දැක්වෙන යන්ත්‍රෝපකරණ සමග

*මැෂින් වර්ගය*
*මාදිලි මැෂින් අංකය*
*අයිතම අංකය*

| *මහන මැෂින්* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| බී 2 | ජුකී - 357 | 12 |
| ඩී 1 | එම්ඕ - 357 | 08 |
| ඊ 2 | එල්බීඑච් - 780 | 01 |
| ඊ 3 | එල්කේ - 1850 | 02 |
| ඊ 4 | ඩීඑෆ්බී - 1404 | 01 |
| ඊ 6 | ඩීඩීඑල් - 555 | 90 |
| ඊ 7 | එම්ඕ - 25165 | 11 |
| ඊ 9 | 373 | 01 |
| ඊ 10 | එල්කේ 1850 | 03 |
| ඊ 16 | ඩීඩීඑල් - 555 | 11 |
| ඊ 17 | එල්එච් - 515 | 16 |
| එස් 1 | බීඩී 2 - එච් 310 | 20 |
| එස් 2 | කේඑම් - 506 | 05 |
| ටී 1 | එල්කේ-3-බී-434 ඊඑක්ස් | 03 |

**වෙනත් වර්ග**

| | | |
|---|---|---|
| ඒ 9 | මෙටල් බටන් ප්‍රෙස් | 10 |
| බී 01 | ස්ටැපින් මැෂින් | 01 |
| බී 06 | බටන් ප්‍රෙස් | 05 |
| සී 01 | ජෙනරේටර් | 01 |
| ජේ 3 | ෆියුසිං මැෂින් | 01 |

**මහන මැෂින්**

| | | |
|---|---|---|
| ජී 1 | එම්ඕ 747 | 07 |
| කේ 1 | එම්ඕ - 2366 ඊ | 08 |
| කේ 2 | බී 832 | 06 |
| කේ 6 | එල්එච් - 162 | 02 |
| ලූක් 13 | බී 8423 | 06 |
| එල් 2 | එෆ්ඊඩී - ටී 2- 240 | 19 |
| කේ 6 | එල් එච් - 162 | 02 |
| කේ 13 | බී – 8423 | 06 |
| එල් 2 | එෆ්ඊඩී - ටී 2 - 240 | 19 |
| එල් 3 | බී 832 | 20 |
| එන් 5 | ඩීටී 2 - බී 925 | 10 |
| එන් 7 | ඩීඑල්කේ - 800 | 23 |
| පී 3 | එල්කේ - 1850 | 05 |
| පී 4 | ඩීඑන්එෆ් - 500 | 29 |
| පී 5 | ඩීඑන්ටී - 860 | 01 |
| පී 6 | එල්ටී 2 - 240 | 09 |
| කේ 5 | අන්ඩර් ට්‍රිමිං අවුට්ං ස්විච් | 01 |
| කේ 11 | ඊස්ට්මන් කටින් | 02 |
| එල් 5 | බ්‍රෑන්ඩ් තයිප් මැෂින් | 01 |
| කිව් 1 | කටිං මැෂින් | 01 |
| ආර් 1 | ඩීසල් බොයිලර් | 01 |
| ටී 3 | ඩීසල් බොයිලර් | 01 |

පහත සඳහන් ද්‍රව්‍යවලින් සමන්විත ව්‍යාපාර බඩු තොග නිම වූ සහ නොනිමි භාණ්ඩ යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ අනෙකුත් ද්‍රව්‍ය වෙන් වෙන් ව සහ එක්ව අමු ද්‍රව්‍ය, උපාංග ප්‍රගමන වැඩ නිමි භාණ්ඩ, අමුද්‍රව්‍ය උපාංග ප්‍රගමන වැඩ නිමි භාණ්ඩ සහ ලී බඩු සවි කිරීම් සහ වෙනත් සෑම වර්ගයක සහ ඕනෑම ආකාරයක හෝ විස්තරයක චංචල දේපල (මෙහි මින් මතු පහත සඳහන් වරිපනම් අංක දරන පරිශ්‍රයන්හි තිබෙන බන්ධනදායිගේ ව්‍යාපාර බඩු තොග ද්‍රව්‍ය, නිම වූ සහ නොනිමි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන)

1. අංක 241 ලෙයාර්ඩ් බ්‍රෝඩ් වේ, කොළඹ 14
2. අංක 80, මහා විද්‍යාල මාවත, කොළඹ 13 සහ
3. අංක 01 රිං රෝඩ් බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කය තුළ කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපය,

සහ බන්ධනදායී දැනට සිටින හෝ ඕනෑම වේලාවක සහ මින් මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන සියලු ගුදම් ගබඩා සහ පරිශ්‍රයන්හි සහ බන්ධදායිගේ ව්‍යාපාර බඩු තොග ද්‍රව්‍ය, නිම වූ සහ නොනිමි භාණ්ඩ සහ ඕනෑම මාදලියක සහ විස්තරයක චංචල දේපළ මෙම බන්ධනය පවත්නා කාලය තුළ මින් මතු කලින් කලට සහ සියලු අවස්ථාවන්හි ගෙන එනු ලැබිය හැකි හෝ බහා තබන හෝ ව්‍යාපාර කටයුතු සඳහා හෝ අලෙවිය හෝ ගබඩා කිරීම සඳහා බන්ධනදායින්ගේ ව්‍යාපාර බඩු තොග, ද්‍රව්‍ය නිමි සහ නොනිමි භාණ්ඩ සහ වෙනත් චංචල දේපල ආදිය මින්මතු ඕනෑම වේලාවක සහ කලින් කලට ගෙන යනු ලබන සියලු හෝ වෙනත් ස්ථානයක් හෝ ස්ථානයක්,

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ වාප්පුවල සහ ගුදම්වල ඇති මෙහි මින්මතු ඒ සියල්ලම බන්ධනදායිගේ වරායේ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ.

අමුද්‍රව්‍ය සහ උපාංග ප්‍රගමන වැඩ, නිමි භාණ්ඩවලින් සැදුම්ලත් ද්‍රව්‍ය යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ කටුනායක ගුවන් තොටුපළ ගබඩාවල සහ ගුදම්වල ඇති (මෙහි මින් මතු ඒ සියල්ලම බන්ධනදායිගේ ගුවන් තොටුපල ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳින්වේ.)

අමුද්‍රව්‍ය සහ උපාංග, ප්‍රගමන වැඩ නිමි භාණ්ඩවලින් සැදුම්ලත් ද්‍රව්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ සෑම වර්ගයකම සියලු වෙනත් භාණ්ඩ සාමූහිකව සහ තනි තනිව, සෙලාන් බැංක් පී එල් සී විසින් මා වෙත පවරන ලද බලය පරිදි ඉහත සඳහන් දේපල මා විසින් 2007ක් වූ ඔක්තෝබර් මස 10 වැනි දින ප. ව. 2.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2007.07.06 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2007.06.27 වැනි දින ඩේලි මිරර්, ලංකාදීප හා 2007.06.25 දින වීරකේසරී පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–*

(1) ගැණුම් මිළෙන් 10% මිල තීන්දු වූ වහාම ගෙවිය යුතුය.

(2) ගැණුම් මිලෙන් ඉතිරි 90% වෙන්දේසි දින සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගෙවිය යුතුය.

(3) පළාත් අධිකාරියට ගෙවිය යුතු දේශීය විකුණුම් බද්ද 1%,(සියයට එකයි)

(4) විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) වන වෙන්දේසිකරුගේ කොමිස් මුදල,

(5) වැය වූ සම්පූර්ණ ප්‍රචාරක වියදමින් 50%ක්,

(6) ලිපිකරුගේ හා ගෝෂකගේ ගාස්තුව රු. 500,

(7) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රු. 2,000.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපි ලේඛන කොළඹ 3 ගාලු පාරේ අංක 90 "සෙලින්කෝ සෙලාන් ටවර්" හි 12 වන මහලේ, සීමාසහිත සෙලාන් බැන්ක් පී එල් සී සහකාර සාමාන්‍යාධිකාරී (දේපළ අංශය) වෙතින් ලබා ගැනීම හා පිරික්සීම කළ හැකිය.

දුරකථන අංක : 074 - 701000/2456789.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර.
දුරකථන අංක: 081-2211025, 071-4755974 ෆැක්ස් අංකය :081-2211025.

09-854/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.